01) පාඩම හෝ ඒකකය - 4.1.1. දවටන, ඇසුරුම්, බහාලුම් නිර්මාණය කරමු

02) ඉගෙනුම් ඵල -

- දවටන, ඇසුරුම්, බහාලුම්වල අනන්‍යතා ලක්ෂණ පිළිබඳව විස්තර කරයි.
- අදාළ නිර්මාණයේ ආකර්ශනීය බව නිෂ්පාදන අලෙවිය වර්ධනයට ඉවහල් වන බව පිළිගනියි.
- දේශීය ආහාර නිෂ්පාදන සඳහා දවටන /ඇසුරුම්/බහාලුම් නිර්මාණය කරයි.
- තම නිර්මාණ අගයයි, රසවිඳියි.

03) ශිෂ්‍යා කළ යුතු කාර්යයන් -

- ඔබට අභිමත පරිදි දැවටුමක, ඇසුරුමක හා බහාලුමක යොදා නිෂ්පාදනය කරන ලද භාණ්ඩ කිහිපයක් පරීක්ෂාකර බලන්න.
    - දවටන - චොක්ලට්, ටොෆී, සබන් දවටන
    - ඇසුරුම් - බීම, දියර කිරි, තේ කොළ ඇසුරුම්
    - බහාලුම් - බිස්කට්, කිරිපිටි, පොල්කිරි බහාලුම්
- දැවටුමක, ඇසුරුමක, බහාලුමක අනන්‍යතා ලක්ෂණ සහ භාණ්ඩ ප්‍රචාරණයේ දී හා අලෙවියේ දී එහි වැදගත්කම පිළිබඳ නිරීක්ෂණය කරන්න
    - ආකෘතිය
    - ප්‍රමාණය
    - ගුණාත්මකභාවය
    - පාරිභෝගික ආකර්ශනය
- අභිමත පරිදි තෝරාගත් මාතෘකාවක් සඳහා දවටනයක් හෝ ඇසුරුමක් හෝ බහාලුමක් නිර්මාණය කරන්න.
- දේශීය ආහාර වර්ගයකින් සාදන ලද නවතම නිෂ්පාදනයක් වෙළෙඳපලට හඳුන්වාදීමට උචිත දවටනයක් /ඇසුරුමක්/බහාලුමක් නිර්මාණය කරන්න.
- තමා කළ නිර්මාණයට උචිත පරිදි සරල, උච්චාරණයට පහසු නමක් යොදන්න.
- අක්ෂර, වර්ණ, උචිත ලෙස භාවිත කරමින් නිර්මාණය නිම කරන්න.
- පාසල ආරම්භ වූ පසුව ඔබගේ නිර්මාණය ප්‍රදර්ශනය කරන්න.

04) ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාර කරගත හැකි පොත් පත්, Website, LMS පාඩම් හා ඉගෙනුම් ආධාරක -




- e-තක්සලාව - https://www.e-thaksalawa.mo.go.lk
- e-නැණ පියස - Course : 10 ශ්‍රේණිය චිත්‍ර කලාව - https://www.enenapiyasa.lk
- ගුරු ගෙදර - නැත
- වෙනත් - (YouTube) - https://youtu.be/FBBJTdTteNM
  https://youtu.be/XnimFqWwQnc
  https://youtu.be/NfcgoNo0OkM
  https://youtu.be/smhtzME0qOM
  https://youtu.be/a9tsuhN8ioQ

05) අතිරේක පොත්/සගරා -

- 10 ශ්‍රේණිය අතිරේක කියවීම් පොත - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව


**සැකසුම - නම - කේ.කේ.කේ.එච්.එච්.එච්. පොල්වත්ත.**

**අධ්‍යාපන ආයතනය - කෑ/දෙහි/ නක්කාවිට ක.වි.**

**දෙහිඕවිට අධ්‍යාපන කලාපය**